ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2025.09.02

| | | |
|---|---|---|
| **පැමිණිලිකාර පාර්ශවය** | : | ආර්. ජේ. ජයලත් මයා,<br>100/8ඒ, ඕවිටිගල උතුර,<br>පුගොඩ. |
| **වින්දිත පාර්ශවය** | : | තිනාලි දෙවුනි රුබසිං ජයවර්ධන ශිෂ්‍යාව,<br>100/8ඒ, ඕවිටිගල උතුර,<br>පුගොඩ. |
| **වගඋත්තරකාර පාර්ශවය** | : | 1. බී. භාග්‍යා පියුමලි මැන්දිස් මෙය,<br>ගුරු සේවය, හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලය.<br><br>2. එච්. පී. දේවිකා සඳමාලි නිශ්ශක මිය<br>ගුරු සේවය, හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලය.<br><br>3. පී. ජී. එච්. නදීපා නිල්මිණි තිලකරත්න මිය<br>ගුරු සේවය, හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලය.<br><br>4. ඩබ්ලිව්. ඩී. ආර්. ජේ. පී. සුරසේන මහතා,<br>විදුහල්පති, හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලය. |

**පැමිණිලි අංකය : HRC/3081/22**

**පැමිණිල්ල**

තම නිවුන් දියණියන් දෙදෙනාගෙන් බාලම දියණිය වන තිනාලි දෙවුනී රුබසිං ජයවර්ධන දියණිය 2022.08.09 දින හංවැල්ල රාජසිංහ විද්‍යාලයට කැඳවා ක්‍රිකට් ක්‍රීඩා කලාප තරග සඳහා කොස්ගම බොස්කෝ විද්‍යාලයට ගෙන ගොස් එහිදී තරග පරාජය වීම හේතුවෙන් පරාජය දරා ගැනීමට නොහැකි වූ හංවැල්ල රාජසිංහ විද්‍යාලයේ සේවයේ යෙදී සිටින ක්‍රීඩා ගුරුතුමිය වන භාග්‍යා පියුමාලි ගුරුවරියට දරුවා විසින් "ඔයාට සිංහල තේරෙන්නේ නැහැනේ" ලෙසින් පවසා තිබූ වචනයකට උරණ වීම මත ඇයගේ අත තදින් කොණිත්තා ඇති අතර ඒ සබදිව දුරකථනයෙන් රාජසිංහ විද්‍යාලයේ ක්‍රීඩා නේවාසිකාගාරයේ ක්‍රීඩා පුහුණුකාරියක වන දේවිකා සඳමාලී නිශ්ශංක ගුරුමහත්මියට සිද්ධිය දන්වා ඇති බවත්ය.

ඒ අනුව දේවිකා සඳමාලී නිශ්ශංක ගුරුතුමිය තමාගේ දියණියන් දෙදෙනා ඇතුළු අනෙකුත් ළමයි නැවත හංවැල්ල රාජසිංහ විද්‍යාලයේ ක්‍රීඩා නේවාසිකාගාරයට කැඳවා තිනාලි දෙව්නී රුබසිං

ජයවර්ධන වන තම දියණිය දණගස්වා අතින් කම්මුලට පහරපිට පහර දී ඇති අතර මිට මොලවා වැරයෙන් ඇයගේ හිසට පහර දී එතැනින් නොනැවතුණු ඇය නදීපා ක්‍රීඩා ගුරු මහත්මිය කැඳවා නැවත ඇයගේ පිටි අල්ලෙන් තම දියණියගේ කම්මුලට හා කනට වැරෙන් පහරක් එල්ල කර ඇති බවය.

දියණිය දණගසා සිටි කොන්ක්‍රීට් ගල්ගොඩේ වැටී ඇති අතර මෙය බලා සිටීමට නොහැකි වූ නිවුන් දියණියන් දෙදෙනාගේ වැඩිමහල් දියණිය දේවිකා සඳමාලි නිශ්ශංක ගුරු මහත්මියට "නංගිට ගහන්න එපා එයාට ගහනවා නම් මටත් ගහන්න" යනුවෙන් පවසා ඇති බවයි.

තවද එතැන සිටි තවත් නම නොදන්නා ක්‍රීඩා ගුරුවරියක් දේවිකා සඳමාලි නිශ්ශංක ගුරුවරියට ඇති මිස් ගැහුවා යැයි පවසා ඇත්තේ පහරදීම බලා සිටීමට නොහැකි වීම නිසා බවත්, ඉන් අනතුරුව තම දියණියන් දෙදෙනා එතැනින් ඉවත් කර ඇත්තේ තොපි ගෙදර පල නැත්නම් කොහේ ගියත් කමක් නැත, වාහනයකට හැපුනත් කමක් නැහැ උඹලා ඕන තැනකට ගිහින් පැමිණිලි කරපල්ලා යනුවෙන් පවසමින් බවත්ය.

දියණියට මේ ආකාරයට දඬුවම් ලබන විට නේවාසිකව ක්‍රීඩා පුහුණුව ලබන ශිෂ්‍යාවන් බලා සිටි බවත් නේවාසිකාගාරය අලුත්වැඩියා කරන යුද හමුදා භටයන්ද බලා සිටි බවත් එම පාසලේ හය ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් බලා සිටි බවත් ක්‍රීඩා තරඟ සඳහා ළමුන් රැගෙන ගිය භාග්‍යා පියුමාලි සහ නම නොදන්නා අනෙක් ක්‍රීඩා ගුරුවරිය බලා සිටියදීම මෙලෙස අවමං සහගත ලෙස වචන භාවිතා කර ඇති බවද තම නිවුන් දියණියන් දෙදෙනාම පවසන බවය.

තම දියණියන් නිවසට එන අතරතුරදී පහර කෑමට ලක් වූ දියණියට දෙසැරයක් වමනේ ගිය බවත් මගදී ක්ලාන්ත සෑදී පාසලේ ඉගෙනුම ලබන දියණියකගේ මවක් දැක ඇයව නැවත නගරයේ ප්‍රධාන දොරටුවෙන් පාසලට රැගෙන ගොස් ඇති අතර නැවත නේවාසිකාගාරයට ගොස් පහර කෑමට ලක්වේ යැයි බිය නිසාවෙන් තම වැඩිමල් දියණිය එම මවගෙන් පාසලට ආපසු බාර දුන් බව කාටවත් නොකියන ලෙසට ඉල්ලා ඇති බවයි. කෙසේ වෙතත් එම මවට පාසලේ අංශ ප්‍රධාන ගුරු මහත්මිය පවසා ඇත්තේ ළමයින් දෙදෙනා හැකි තරම් නිවසට යෑමට ආසන්නයටවත් රැගෙන යාමට උත්සාහ කරන ලෙසයි. ඒ අනුව මෙම අම්මා ළමුන් දෙදෙනා නිවසටම රැගෙන එන ලද බවයි.

නිවසට පැමිණි තම දියණිය ළඟම තිබෙන දොම්පේ දිසා රෝහලට ඇතුලත් කරන ලද බවත් එහිදී මේ සබැදිව දොම්පේ පොලිසියට වෛද්‍යවරයා දැනුම් දී ඇති බවත් 2022.08.10 වන දින දොම්පෙ රෝහලෙන් ටිකට් කපන ලද බවත් තම දියණිය එදිනම රාගම ශික්ෂණ රෝහලට රැගෙන යන ලද බවයි. රාගම රෝහලේ වෛද්‍යවරයා විසින් රෝහලේ පොලිසියට දැනුම් දී ඇති බවත් 2022.08.11 වන දින රාගම රෝහලෙන් ටිකට් කැපූ බවත් අධිකරණ වෛද්‍යවරයා නැවත ළමා මානසික සායනයට යොමු කර ඇති බවත් වර්තමානය වන විට තම දියණිය රාගම ශික්ෂණ රෝහලේ මානසික සායනයේ ප්‍රතිකාර ලබා ගනිමින් සිටින බවත්ය.

මේ සම්බන්ධයෙන් හංවැල්ල පොලිසියට WCIB 40/49 යටතේ 2022.08.10 දින පැමිණිල්ලක් සිදුකර එය සමථ මණ්ඩලයට යොමු කර ඇති බවත්, තවද ජාතික ළමා ආරක්ෂණ අධිකාරියට 11/22/08/43/01/6384 යටතේ 2022.08.22 පැමිණිලිකරන ලද බවත්, තම දියණිය කෲර අමානුෂික අවමං සහගතව හිංසා කර ඇති බැවින් ඒ පිළිබඳ සාධාරණයක් ඉටු කර ගැනීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ල සිදු කරන ලද බවය.

<u>**පැමිණිල්ල සනාථ කිරීමට ඉදිරිපත් කර ඇති සාක්ෂි**</u>

1. **පැමිණිලි පාර්ශවය විසින් 2022.10.10 දිනැති ලිපිය මඟින් වින්දිත දැරියගේ මව විසින් සිදුවීම සිදු වී දරුවන් නිවසට පැමිණි පසු සිදුවීම සිදුවූ දින හෝ එදිනට පසු ඊට ආසන්න දිනක වගඋත්තරකාර නිශ්ශංක සහ නදීපා ගුරුතුමියන් සමඟ යෙදුනු දුරකථන සංවාදයක හඬ පටි අඩංගු සංයුක්ත තැටියක් සහ දරුවා රෝහලේ සිටියදී ගන්නා ලද ඡායාරූප කිහිපයක් ඉදිරිපත් කර ඇත.**
එම දුරකථන සංවාද අතරතුර වගඋත්තරකාර නිශ්ශංකා ගුරුතුමිය වින්දිත දැරියට කම්බුල ප්‍රදේශයට එක පහරක් එල්ල කල බවද එසේම නදීපා ගුරුතුමිය විසින්ද වින්දිත දැරියගේ කම්බුල ප්‍රදේශයට පිට අල්ලෙන් පහරක් ගැසූ බව ප්‍රකාශ කර ඇත.

2. **දිවුරුම් ප්‍රකාශය මඟින් සාක්ෂි ඉදිරිපත් කිරීම**

අංක 373, මැදලන්ද, දොම්පේ හි පදිංචි තිනාලි ධාරණී රුබසිංහ ජයවර්ධන යන වින්දිත දැරිය සමඟ එම අවස්ථාවේ සිටින ලද නිවුන් සහෝදරිය විසින් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් පැමිණිල්ලේ සඳහන් කරුණු තහවුරු කර සිටින අතර ඊට අමතරව එකී දිවුරුම් ප්‍රකාශයේ 05, 06 සහ 07 ඡේද මඟින් 2022.08.04 දින පැවැති වොලිබෝල් තරඟාවලිය සඳහා හංවැල්ල රාජසිංහ විද්‍යාලයේ කණ්ඩායම නියෝජනය කරමින් තරඟ සඳහා තමා සහ තම නිවුන් සොයුරිය සහභාගි නොවූ බවයි. එම තරඟය සඳහා පාසලේ කණ්ඩායම සඳහා අවශ්‍ය පමණ ක්‍රීඩකයන් සිටි බැවින් ඔවුනගේ වැඩිමහල් සොහොයුරිය නීතිඥවරියක් වශයෙන් දිවුරුම් දීමේ උත්සවයට සහභාගිවූ බවත් ඒ සබැඳිව යම් විරසකයක් ක්‍රීඩා ගුරුවරුන් තුල පැවැති බවට කරුණු ඉදිරිපත් කර ඇත.

3. **අධිකරණ වෛද්‍ය නිලධාරිගේ වාර්තාවට අනුව**

අ. **රෝගී ඉතිහාසය ලෙස:**
වින්දිත දැරියගේ පාසලේ ගුරුවරියන් වන දේවිකා සඳමාලි නිස්සංක, භාග්‍යා සහ නදීපා යන අය ප.ව. 1-1:30 දක්වා අතරතුලදී පාසලේදී තමන්ට පහරදුන් බවත් දේවිකා යන අය තමාගේ හිසටද, කම්බුලටද කණටද පහර දුන් බවත් නදීපා යන අය තමන්ගේ කම්බුලට සහ අත්වලට පහර දුන් බවත් භාග්‍යා යන අය තමාගේ අත කෙනිත්තූ බවත් ප්‍රකාශ කර ඇත

ආ. **තුවාල ලෙස :**

i. සෙන්ටිමීටර් ½ x 1 ප්‍රමාණයේ වම් අතේ ඉහල බාහුවේ ඉදිරිපස සීරීමක් නිරීක්ෂණය වූ බව

ඇ. **මතය**

i. එම තුවාලය මොට බලයකින් වූවක් බවත්,
ii. එම තුවාලය බරපතල සනයේ එකක් නොවන බවත්,
iii. වින්දිතයාගේ කියාපෑම අනුව (තුවාලය සිදුකල අන්දම හා කාලය අනුව) ගැලපෙන බවත්

තවද අධිකරණ වෛද්‍ය නිළධාරී විසින් දැරිය <u>මානසික වෛද්‍ය සායනයක්</u> සඳහා රාගම රෝහල වෙත යොමු කර ඇත.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2022.12.02 සහ 2024.08.28 වන දින පරීක්ෂණයක් පවත්වා ඇත.

**01 වන වගඋත්තරකා භාගයා පියුමලි ගුරුතුමියගේ ප්‍රකාශය**

පාදුක්ක, මීරියගල්ල, මාලේගෙදරවත්ත, අංක 228/7 හි පදිංචි බලාපුවඩුගේ භාග්‍යා පියුමලි මැන්ඩිස් යන අය 2024.08.24 වන දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයේදී සහ 2024.10.24 දිනැති දිවුරුම් ප්‍රකාශයක්ද ඉදිරිපත් කරමින් පැමිණිල්ලේ කරුණු සම්බන්ධයෙන් ප්‍රකාශ කර සිටින්නේ, 2022.05.04 වන දින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3(1) ශ්‍රේණියට අනියුක්තව සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය ගුරුවරියක ලෙස හංවැල්ල රාජසිංහ විද්‍යාලයට පත්වීම් ලද එම විද්‍යාලයේ සේවය කරන බවත් 2022 වර්ෂයේ කලාප ක්‍රිඩා තරඟ සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් යොමු කිරීම සිදු කරන ලද බවයි.

පැමිණිලිගත සිද්ධිය සිදු වූ 2022.08.09 වන දින සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියට කලුඅග්ගල ශාන්ත බොස්කෝ විද්‍යාලයට ළමුන් 13 ක් පමණ පාසලේ බස් රථයෙන් උදේ 7.30 – 8.00 ට පමණ රැගෙන ගිය බවත් අපොස (සා/පෙළ) විභාගය නිම කර නේවාසිකාගාරයේ රැඳී නොසිටි නිවුන් දරුවන් දෙදෙනා පුහුණු වීම් වලටද සහභාගී නොවුවද එම දරුවන් දක්ෂ බව අසා ඇති බැවින් ධරණි නැමැති දියණිය පළමුව පන්දුවට පහර දීම සඳහා උදාරි නැමැති දියණිය සමඟ යොමු කල බවත් තරඟයේ ජයග්‍රහණය ලබා ගැනීම සඳහා ලකුණු අසූ ගනනක් සහ පන්දු වාර 4 ක් අවශ්‍යව තිබූ බැවින් තමා ක්‍රීඩා පිටියේ එළියේ සිට එම දියණියට "පුතේ එන හැම බෝලයකටම පහර දෙන ලෙසට" උපදෙස් ලබා දුන් බවයි.

ඒ අතරතුරදී අනෙක් නිවුන් දියණිය වන දෙවුනි තමා අසල පහල වාඩි වී සිට "ඔයාට තේරෙන්නේ නැහැනේ එතැනට ගියාම වෙනදේ" කියා පැවසූ විට තමා විසින් "ඒක තමා පුහුණුවීම් වලට සහභාගි විය යුත්තේ" යනුවෙන් පැවසූ බවත් එවිට නැවත දෙව්නි දියණිය ඉතා අශෝභන ලෙස කෑ ගසා "ඔයාට සිංහල තේරෙන්නේ නැහැනේ, මම කියන දේ" යනුවෙන් පැවසූ බවත් ඉන් පසු **තමා පහත්වී දෙව්නි දියණියගේ අතින් අල්ලා ඇයගේ කණට කර** "මම ඔයාගේ සහෝදරියෙක්ද? යාලුවෙක්ද? ඇයි ඔයා මට ඔහොම කතා කරන්නේ, මම මෙතන කෑගහන්නේ නැත්තේ ඔයාගේ ආත්ම ගරුත්වය ගැන හිතලා" යනුවෙන් පැවසූ බවත් ඒ සමඟම තරඟය අවසන් වූ බවත් ප්‍රකාශ කර සිටින ලදී.

ඉක්බිතිව පරීක්ෂණ නිලධාරී විසින් හරස් ප්‍රශ්න අසන ලදුව තමා පහත් වී අත ඇල්ලීමේදී තදින් කොණිත්තීමක් සිදු නොකල බවත් සාමාන්‍ය ආකාරයෙන් පමණක් අතින් ඇල්ලූ බවත් දියණිය අපහසුතාවයට පත්වන ආකාරයට කිසිවක් සිදු නොකල බවත් පාසල් කණ්ඩායම ලකුණු 23 පමණ ලබාගෙන පරාජයට පත්වීම නිසා පාරේ බස් රථයෙන් ළමුන් සමඟ නැවත පාසලට පැමිණි බවත් තරඟය පරාද වුවාට පසුව පාසලට දුරකථන ඇමතුමකින් හෝ දන්වා නොසිටි බවත් දෙව්නි දියණියගේ හැසිරීමත් සමඟ තමා දැඩි අපහසුතාවයට පත්වූ නිසා ඉක්මනට පාසලට ළමුන් රැගෙන ආ බවයි.

එසේම පාරේ බස් රථයෙන් නැවත පැමිණීමට හේතුව පිරිමි ළමුන් සඳහා තරඟයක් සුහාරත පාසලේ පැවැති බැවින් එම ළමුන් රැගෙන ඒම සඳහා පාසලේ බස් රථය යොදවා තිබූ හෙයින් හා මෙම තරඟය පාසල ආසන්නයේ පැවැත්ම හේතුවෙන් බවයි.

ළමුන් පාසලට රැගෙන විත් නේවාසිකාගාරයේ විනය භාර නිශ්ශංකා ගුරුතුමියට ක්‍රීඩා පිටිය හා නේවාසිකාගාරය ආසන්නයේදීම විවෘත ස්ථානයකදී ළමුන් භාර දුන් බවත් එම අවස්ථාවේදී නේවාසිකාගාරය ඉදිකිරීම් කටයුතු සිදු කරමින් තිබූ බැවින් ඒ අවට ගල් වැලි ආදි ඉදි කිරීම් ද්‍රව්‍ය තිබූ

බවත් එම අවස්ථාවේදී ආසන්නයේ ක්‍රීඩා තරඟවලට සහභාගී වූ සිසු සිසුවියන් හා පාසලේ 6, 7 ශ්‍රේණි වල දරුවන් හා ඉඳි කිරීම් කටයුතු වල නිරත වී සිටි යුධ හමුදා නිලධාරීන් ද සිටි බවත් එම අවස්ථාවේදී නිශ්ශංකා ගුරුතුමිය පොදුවේ තරඟයට මොකද වුනේ යැයි විමසීමේදී ළමුන් "දෙව්නිලා භාග්‍යා ගුරුතුමියට නරක විදිහට කතා කලා" යනුවෙන් සිද්ධිය පැවසූ විට නිවුන් සොහොයුරියන් අදාල සිද්ධිය සම්බන්ධයෙන් නිශ්ශංකා ගුරුතුමිය දැනුවත් කල ළමයාට බැන වැදුන බවයි. ඉන්පසු නිශ්ශංකා ගුරුතුමිය සිද්ධිය සම්බන්ධයෙන් කටයුතු කිරීම ආරම්භ කර එම දරුවන්ගේ මවට දුරකථන ඇමතුමක් ලබා ගෙන අනතුරුව එම දුරකථන ඇමතුම තමාට ද ලබා දුන් බවයි.

දුරකථනයෙන් දරුවන්ගේ මව සිදුවීම සම්බන්ධයෙන් සමාව අයැද සිටින ලද බවත් දරුවන්ගේ හැසිරීම අන්තිම නරක හෙයින් තමාගේ සිත් රිදවීමක් සිදු වූ බව පැවසීමේදී දරුවන්ගේ මව නැවතත් සමාව අයැද මෙම නිවුන් දරුවන් විශේෂ නිවුන් දරුවන් බවත් දෙමාපියන් වුවද එක ළමයෙකුට සැර කල විට අනෙත් ළමයා කලහකාරී ලෙස හැසිරෙන බව පැවසුවා. ආයේ මෙහෙම දේවල් නොවන ලෙස වගබලා ගන්නා බවත් දන්වා සිටිමින් ඇමතුම අවසන් කරන ලද බවයි.

ඇමතුම අවසානයේ දුරකථනය නිස්සංකා ගුරුතුමියට ලබා දීමට ළමුන් සිටින ස්ථානයට පැමිණීමේදී ගර්භනී තත්වයේ සිටි නිස්සංකා ගුරුතුමිය එක නිවුන් ළමයෙකු විසින් තල්ලු කල බවත් එහි සිටි ළමයෙකු එම ගුරුතුමිය අල්ලාගෙන එතන වාඩි කල බවත් ගුරුතුමියට දාඩිය දමා තිබූ බවත් එතන සිටි ළමයෙකු නදීපා ගුරුතුමියට සිද්ධිය දැනුම් දුන් බවත් නදීපා ගුරුතුමිය පැමිණි පසු තමාට දුරකථන ඇමතුමක් ලැබුනු නිසා එම ස්ථානයෙන් බැහැර ගිය බවයි.

එසේම තමා සහ නිස්සංකා ගුරුතුමිය විසින් නිවුන් දරුවන්ගේ මවට එකී සිදුවීම පිළිබඳ දැනුම් දුන් බව ඔවුන්ට පැවසීමත් සමඟ එම දියණියන් දෙදෙනා කලහාකාරී සහ/හෝ අස්වාභාවික හැසිරීම තවදුරටත් වර්ධනය වූ බවත්, එකී හැසිරීම් වැලැක්වීමට අප විසින් ගන්නා ලද සියලුම උත්සාහයන් ව්‍යර්ථ වූ බවත් මෙම සිදුවීම අතරතුර තමා හෝ වෙනත් යම් කිසිදු ගුරුවරයෙකු විසින් එම නිවුන් දරුවන් දෙදෙනා කායිකව හෝ මානසිකව පීඩාවකට පත් නොකළ බවත්, ඔවුන්ගේ කලහාකාරී සහ/හෝ අස්වාභාවික හැසිරීම් රටාව හේතුවෙන් ඔවුන්ට හෝ වෙනත් පාර්ශවයකට ඇතිවිය හැකි හානිය හැකිතාක් අවම කිරීමට පමණක් උත්සාහ ගන්නා ලද බවයි.

**<u>02 වන වගඋත්තරකාරිය වන දේවිකා සඳමාලි නිශ්ශංක ගුරුතුමියගේ ප්‍රකාශය</u>**

දෙල්ගොඩ, කම්හල්වත්ත, අංක15/2 හි පදිංචි හේවාසුන්දර පේඩිගේ දේවිකා සඳමාලි නිස්සංක යන අය 2024.08.28 වන දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයේදී සහ 2024.10.24 දිනැති දිවුරුම් ප්‍රකාශයක්ද ඉදිරිපත් කරමින් පැමිණිල්ල සම්බන්ධයෙන් ප්‍රකාශ කර සිටින්නේ, 2013.04.24 වන දින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3(1) ශ්‍රේණියට අනියුක්තව සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය ගුරුවරියක ලෙස හංවැල්ල රාජසිංහ විද්‍යාලයට පත්වීම් ලද ලද බවත් එතැන් සිට මේ දක්වා රාජසිංහ විද්‍යාලයට අනුබද්ධ කොළඹ දිස්ත්‍රික් ක්‍රීඩා පාසලෙහි නේවාසිකව සේවය කරන බවයි.

පැමිණිලිගත සිද්ධිය සිදු වූ 2022.08.09 වන දින 6 වන කාල පරිච්ඡේදයේදී උගන්වා අවසානයේදී ක්‍රීඩා පිටිය අසල තියෙන වතුර ටැංකියෙහි වාඩි වී සිටින විට ළමුන් තරග ඉවර වී එනවා දුටු බවත් එවිට තරඟයට කුමක් සිදුවුයේද යන්න පිළිබඳව ළමුන්ගෙන් විමසා සිටින විට දෙව්නි විසින් භාග්‍යා ගුරුතුමියට බැන වැදුන බවත් කුමක් කියා බැන වැදුනේද යන්න පිළිබඳව විමසූ විට සිංහල තේරෙන්නේ නැද්ද යනුවෙන් ඇසූ බවත් දන්වා සිටියා.

මේ පිළිබඳව වැඩිදුර විමසීමේදී ධරනි නැමැති නිවුන් සොයුරිය පිතිකරණයේ යෙදෙමින් සිටින විට තමාට ලැබෙන පන්දු වලට පහර නොදී නිදැල්ලේ යාමට ඉඩ හැරීම නිසා ලැබෙන සෑම පන්දුවකටම පහර දෙන ලෙස භාග්‍යා ගුරුතුමිය විසින් දෙසැරයක් පමණ කෑ ගසා පැවසූ බවත් එවිට ළඟ සිටි

දෙවනි දියණිය "ඔයා දන්නේ නැහැනේ එතන තියෙන පීඩනය" යනුවෙන් කිවූ බවත් එවිට භාග්‍ය ගුරුතුමිය "ඒක තමා පුහුණුවීම් වලට සහභාගි විය යුත්තේ" යනුවෙන් පැවසූ බවත් ඊට පස්සේ දෙවනි දියණිය "ඔයාට සිංහල තේරෙන්නේ නැහැනේ" යනුවෙන් පැවසූ බව දන්වා සිටින ලද බවය. ඉන්පසු **තමා ළමුන්ගෙන් සැර කර ඒලෙස කිව්වාද** යන්න විමසූ බවත් එවිට දෙවනි දියණිය "භාග්‍ය මිස්ට කිව්වනේ පුහුණු වීම් වලට එන්න බැ කියලා. ඇයි සැරෙන් සැරේ ඒකම කියලා කරදර කරන්නේ කියලා" යැයි පැවසූ බවත් එවිට තමා විසින් "මේ වෙලාවේ නේවාසිකාගාරය අලුත් වැඩියා කරන

නිසා පුතේ අපි උදේ ඇවිත් පුහුණුවීම් කර හවස ගෙදර යන්න කියලානේ කියන්නේ" ලෙසින් පවසනවාත් සමඟ ධරණි දියණිය ආවේගශීලිව හැසිරුණු බවයි.

එම අවස්ථාවේදී තමාට විස්තර කියූ දියණියට බැණ වදිමින් ආවේගශීලිව කතා කරමින් කලහකාරී ලෙස හැසිරීමත් නිසා **ඔවුන් දෙදෙනා පසෙකින් වාඩිකර** තබා එම ස්ථානයෙන් මදක් එහාට ගොස් තමා දියණියන්ගේ මවට දුරකථන ඇමතුමක් ලබා ගනිමින් ඔවුන් භාග්‍ය ගුරුතුමිය සමඟ ප්‍රශ්නයක් ඇති කරන ගෙන ඇති බවට දන්වා සිද්ධිය විස්තර කරන ලදී. එහිදී මෙම නිවුන් දරුවන් විශේෂ නිවුන් දරුවන් බවත් සමහර අවස්ථා වලදී නිවසේදීද මෙවැනි ආකාරයට හැසිරෙන බවත් දන්වා සිටියා. තමා දරුවන්ගේ මවට පැමිණ ළමුන් රැගෙන යන ලෙසට දන්වා සිටියද ඇය උගන්වන පාසලෙන් එම අවස්ථාවේ පැමිණීමට හැකියාවක් නොමැති බැවින් ළමුන් ගෙදර එවන ලෙසට දන්වා සිටි බවත් ඉන්පසුව තමා විසින් එම දුරකථන ඇමතුම භාග්‍යා ගුරුතුමියට ලබා දුන් බවයි.

ඉන්පසුව තමා ළමුන් සිටින ස්ථානයට නැවත පැමිණ "ඔයාලා ගෙදරදිත් හැසිරෙන්නේ මෙහෙමයි අම්මා මට කිව්වා, ඔයාලා එහෙම හැසිරෙන්න එපා." යනුවෙන් නිවුන් දරුවන්ට පැවසූ බවත් එවිට දෙවණි දියණිය සමච්චලයට මෙන් හිනා වී "ඒ අපේ හැටි" ලෙස පැවසූ බවත් එහිදී ඔවුන්ගේ ද්වේශ සහගත සහ/හෝ නොහික්මුණු හැසිරීම පාලනය කිරීම සඳහා තමා අත **උස්සලා පහරක් ගහන්න හැදුවා එහෙත් මම ගැහුවේ නැහැ.** එවිට ධරණි විසින් මගේ දකුණු අත අල්ලා මාව පිටු පසට තල්ලු කරනවාත් සමඟම පිටුපස සිටි සජීමා දියණිය තමා අල්ලා ගෙන ටැංකිය ලඟින් වාඩි කල බවත් නැත්නම් තමා ටැංකියට වැටෙන බවයි.

ඒත් එක්කම ධරණි අත මිට මොලවගෙන තමාගේ මුහුණටම ගහ ගත්තා එයාගේ කොණ්ඩය ඇදලා අවුල් කරගෙන දැන් ඇති ද දැන් ඇතිද කියා දෙසැරයක් ඇසූ බවත්ය.

ඒ අවස්ථාවේදී මාස 08 ක ගර්භණී මවක් නිසා ශරීරයට යම් අපහසුතාවයක් දැනුන බැවින් දරුවෙකුට වතුර විදුරුවක් ගෙනත් දෙන ලෙස කියූ බවත් ඒ අතර කාලයේදී නදීපා ගුරුතුමිය එතනට පැමිණ තමාගේ දාඩිය පිහදාලා කොහොමද කියලා ඇසුවා. තමා පොඩි අපහසුතාවයක් තියෙනවා කියලා කිවූ බවත් නදීපා ගුරුතුමිය ළමුන්ගෙන් මොකක්ද සිද්ධ වුනේ කියලා ඇසූ විට ළමුන් සිදුවීම් පැවසුවා. නැවතත් නිවුන් දරුවන් දෙදෙනා කලහාකාරී ලෙස හැසිරී තමා සිටින දෙසට ආ බවත් එවිට නදීපා ගුරුතුමිය තමා සහ ළමුන් දෙපැත්තකට කරලා මොනවද කිව්වා.

ඉන් පසු ළමුන්ට ගුරුවරුන්ට ගරු කරන ලෙසත් නරක විදිහට නොහැසිරෙන ලෙසත් නිවුන් දරුවන් තරඟ වලට යනවා නම් ඔවුන් අපිට පාලනය කරන්න බැරි නිසා දෙමාව්පියන් සමඟ යා යුතු බවත් දන්වා මේ සම්බන්ධයෙන් අදාල ආයතනය දැනුවත් කරන බවද පවසා පාසල අවසන් වීමට සීණුව නාද වූ බැවින් ළමුන් සියල්ල නිවෙස් වලට යවා අපිද නිවෙස් වලට ගියා බව පවසන ලදී.

මෙම සිද්ධිය වන විට තමා මාස 08 ක ගැබිණියක්ව සිටි බවත් මීට පෙර අවස්ථාවකදී තමාට ගබ්සාවක්ද සිදුවූ බැවින් මේ කාලය තුළ විදුහල්පතිගේ අවසරය මත ළමුන් තරඟ වලට රැගෙන යන්නේ නැති බවත් අවම තරමින් ශබ්ද නඟා ඉගැන්වීම හෝ වේගයෙන් ඇවදීමත් එම කාලය තුළ දී සිදු නොකල බවත් මෙම සිදුවීම හේතුවෙන් ඇති වූ මානසික සහ කායික පීඩනය හේතුවෙන් ඇතිවූ

අධිරුධිර පීඩන තත්ත්වය මත රෝහල්ගත කෙරුණු බවත්, සිසේරියන් සැත්කමක ආධාරයෙන් දරුවා බිහි කිරීමට සිදු වූ බවත් වැඩිදුරටත් කොමිෂන් සභාවට දන්වා සිටි අතර අදාල වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

**03 වන වගඋත්තරකාරිය වන නදීපා නිල්මිණි තිලකරත්න මියගේ ප්‍රකාශය**

පන්නිපිටිය, කොට්ටාව, මාලඹේ පාර, රණසිංහ මාවතේ අංක 1650/2 හි පදිංචි පහල ගෙදර හේවයලාගේ නදීපා නිල්මිණි තිලකරත්න යන අය 2024.08.28 වන දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයේදී සහ 2024.10.24 දිනැති දිවුරුම් ප්‍රකාශයක්ද ඉදිරිපත් කරමින් පැමිණිල්ල සම්බන්ධයෙන් ප්‍රකාශ කර සිටින්නේ, 2012.11.26 වන දින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3(1) ශ්‍රේණියට අනියුක්තව හංවැල්ල රාජසිංහ විද්‍යාලයේ ඉංග්‍රිසි මාධ්‍ය සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය ගුරුවරියක ලෙස සේවය කරන බවත් එම පත්වීමට සමගාමීව රාජසිංහ විද්‍යාලයට අනුබද්ධ කොළඹ දිස්ත්‍රික් ක්‍රීඩා පාසලෙහි නේවාසික පාලිකාවක් නොමැති වූ හෙයින් 2012.11.26 දින සිට 2016.06.15 දින දක්වා එම නේවාසිකාගාරයෙහි නේවාසික පාලිකාවක් වශයෙන් නේවාසිකව සේවය කළ බවත් ඉන් අනතුරුව නේවාසිකාගාරයේ නොවුවද පාසලේ සියලු කටයුතු සඳහා උපරිම දායකත්වය ලබා දෙන බවයි.

පැමිණිලිගත සිද්ධිය සිදු වූ 2022.08.09 වන දින 8 වන පරිච්ඡේදයේදී තමාට විෂයක් නොතිබූ බවත් තමා නේවාසිකාගාරයේ වැසිකිලියේ සිටින අවස්ථාවේ දරුවෙක් ඇවිත් කිහිපවතාවක් "මිස් එන්න, චුටි මිස් ඉන්න තැනට එන්න" කියලා කිව් බැවින් ඒ අනුව තමා එළියට ඇවිත් අදාල ස්ථානයට යන කොට නිශ්ශංකා ගුරුතුමිය ටැංකිය උඩ ඉදගෙනද තරහයට ගිය ළමුන් සියලු දෙනා එතන හිටගෙනද හිටි බවත් ඒ අතර නිවුන් දරුවන් දෙදෙනාද සිටි බවයි.

තමා විසින් කුමක් සිදු වුණිද කියා එතැන සිටි ළමුන්ගෙන් විමසීමේදී, "නිවුන් සොයුරියන් නිශ්ශංකා ගුරුතුමිය තල්ලු කල බවත් සජීමා එම අවස්ථාවේදී අල්ලා ගත් බවත් ගුරුතුමිය කම්පනයට පත්ව දාඩිය දමමින් සිටි බවත් එවිට නිවුන් දරුවන්ගෙන් එක් අයෙකු අත මිට් මොලවා එයාගේම මූණට හරියට නිකන් ආරූඩවෙලා මායම් වෙලා වගේ අතින් ගහ ගත්තා" කියා ළමයි තමාට පවසන අතරතුරදී නිවුන් ළමයින් නැවත ආවේගශීලීව නිශ්ශංකා ගුරුතුමිය දෙසට එන බව දුටු නිසා ඒ වනවිටත් මාස අටක ගැබිණියක වූ නිශ්ශංකා ගුරුතුමියට යම් අනතුරක් විය හැකි බවට තමාට අවබෝධ වූ බැවින් එම නිවුන් දරුවන් දෙදෙනා නිශ්ශංකා ගුරුතුමිය අසලට එන එක වැළැක්වීම සඳහා තමා **ඔවුන් අතරට පැමිණ** ඔවුන්ට අවවාද කරන ලද බවයි.

ඉන් අනතුරුව පාසල අවසන් වූ බවත් දරුවන් දෙදෙනා තමාට වැඳ නික්ම ගිය බවත් පාසල අවසන් වීමෙන් පසු තමා බැංකුවට ගොස් නැවත පුහුණු වීම් සඳහා පාසලට පැමිණි අතර පස්වරු 2.30 ට පමණ නිවුන් දරුවන්ගේ පියා පාසලට පැමිණ සැරෙන් තමා ආමන්ත්‍රණය කල බවත් තම දරුවන්ට පහර දී ඇති බවත් තමාට පාරේ බැහැලා හෝ ක්‍රීඩා පිටියකට යාමට නොදෙන බවත් දරුවා දැනට රෝහල් ගත කර ඇති බවත් පවසා සිටින ලද බවයි.

දරුවන් පාසලෙන් තමාට වැඳ නික්ම යාමේදී ඔවුන් කිසිදු ශාරීරික අපහසුතාවයකින් පෙළුණු බවට කිසිවක් නිරීක්ෂණය නොවූ බවත් එක දරුවකුගේ හිස කෙස් පමණක් අවුල් වී තිබූ බව පමණක් දුටු බවත් තමා මෙම නිවුන් දරුවන්ට කිසිදු හානියක් වන අයුරින් කටයුතු නොකල බවත් ප්‍රකාශ කරන ලදී.

**04 වන වගඋත්තරකාර විදුහල්පති ඩබ්ලිව්. ඩී. ආර්. ජේ. පී. සූරසේන මහතාගේ කරුණු දැක්වීම**

පැමිණිලිගත සිද්ධිය සම්බන්ධයෙන් 2022.12.02 වන දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයේදී සහ 2022.10.03 දිනැති වාර්තා ඉදිරිපත් කරමින් පැමිණිල්ල සම්බන්ධයෙන් ප්‍රකාශ කර සිටින්නේ, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2022.09.26 දිනැති ලිපිය මඟින් යොමු කරන ලද පැමිණිල්ල සහ ඇමුණුම් ගත ලේඛණ 2022.09.30 වන දින තමාට ලද බවත් එතෙක් පැමිණිලිගත සිද්ධිය සම්බන්ධයෙන් කිසිදු චෝදනා සහිත පැමිණිල්ලක් හෝ තොරතුරක් තමා වෙත පැමිණිලිකරු වන ආර්. ජයලත් මහතා විසින් හෝ ටී. දෙව්නි රුබසිංහ ජයවර්ධන ශිෂ්‍යාව සෘජුව හෝ වක්‍රව තමා දැනුවත් නොකල බවය.

මෙ සබැදිව පොලිසිය මගින්ද තමා වෙත දැනුම් දීමක් සිදු කර නොමැති බවත් එහෙත් 2022.08.15 දිනදී පොලිසියට කැඳවා උක්ත කාරණය සම්බන්ධයෙන් ප්‍රකාශ ලබා ගත් බවට චෝදනාව එල්ලවී ඇති ගුරුවරියන් තිදෙනා තමා වෙත ප්‍රකාශ කරන ලද බවත් ඔවුන්ගෙන් විස්තර විමසා චෝදනා එල්ල කර ඇති දෙමාපියන් සමඟ සාකච්ඡා කිරීමට තීරණය කරන ලද බවයි.

එහෙත් අවස්ථා කිහිපයකදී දුරකථනය මගින් දෙමව්පියන් සම්බන්ධ කර ගැනීමට උත්සාහ කලද එය සාර්ථක නොවුණ බවත්, ඉන් අනතුරුව ක්‍රීඩා පුහුණුකරු ජයලාල් රත්නසූරිය මහතා හා නියෝජ්‍ය විදුහල්පති රෝහණ විජේතුංග මහතා කැඳවා ඔවුන් මගින් දෙමව්පියන්ට තමා හමු වන ලෙස පණිවිඩ යැව්වද එහෙත් චෝදනා එල්ල කරන දෙමාපියන් හෝ දරුවන් තමා හමුවට පැමිණියේ නැති බවත් තත්වය එසේ තිබියදී 2022.08.19 දින දී සියලු ක්‍රීඩා ගුරුවරුන් කැඳවා තත්වය පිළිබඳ පැහැදිලි කිරීම හා ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කරන ලද බවයි.

එමෙන්ම 2022.08.22 දින පැවැත්වෙන සමථ මණ්ඩලයේදී පැමිණිලිකාර පාර්ශවය හා සාකච්ඡා කොට එළඹෙන නිගමනයකට එකඟව සමථයකට පත් කර ගැනීමට කටයුතු කරන ලෙස චෝදනාවට ලක්වූ ගුරුවරියන් තිදෙනාට දැන්වූ බවත් පසුව මෙම සිදුවීම් පෙළ ලිඛිතව තමා වෙත ඉදිරිපත් කරන ලෙස චෝදනාවට ලක් වූ ගුරුවරියන් තිදෙනාට දැන් වූ අතර ඔවුන් 2022.09.23 දින දී ලිඛිතව තොරතුරු තමා වෙත ලබා දෙන ලද බවයි.

එසේම 2022.12.02 වන දින කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයේදීද මෙම පැමිණිල්ලට අදාල සිද්ධිය සම්බන්ධව අගතියට පත්ව ඇති බව සඳහන් පැමිණිලිකරුගේ දියණිය සහ එම ගුරුමහත්මිය ඇතුළු පාර්ශවයන් සමඟ වැඩිදුරටත් සාකච්ඡා කර යම් කිසි එකඟතාවයකට හැකියාව පවතී නම් ඒ සම්බන්ධව මැදිහත්ව කටයුතු කිරීමට විදුහල්පතිවරයා කැමැත්තෙන් කටයුතු කරන බවයි.

**නිරීක්ෂණ**

01. හංවැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය ක්‍රීඩා පාසලක් වන අතර සිද්ධිය වූ දින එනම් 2022.08.09 දින පැවැති කාන්තා ක්‍රිකට් තරඟාවලියට සහභාගිවීම සඳහා ගුරු සේවයේ මාස තුනක් පමණ සේවා කාලයක් තිබූ 01 වන වගඋත්තරකාර භාග්‍යා ගුරුතුමිය භාරයේ කොස්ගම බොස්කෝ විද්‍යාලයට සිසුන් රැගෙන ගොස් ඇත. ක්‍රීඩා තරඟය තුල ඇය විසින් ක්‍රීඩා පිටියේ පන්දුවට පහර දෙමින් සිටි වින්දිත දැරියගේ නිවුන් සොයුරියට ලබා දුන් උපදෙස් පිළිනොපැදීම හා ඊට වින්දිත දැරිය විසින් විරුද්ධව ප්‍රතිචාර දැක්වීම හරහා දැඩි අපහසුතාවකට ඇය පත්වීමත් සමඟම තම නොමේරූ අත්දැකීම් හා තම ආවේගය පාලනය කර ගැනීමට නොහැකිව වින්දිත දැරියගේ අතින් අල්ලා පහත් වී යම් ප්‍රකාශයක් සිදු කල බව කොමිෂන් සභාවේ පැවැති පරීක්ෂණයේදී පිළිගෙන ඇත. එසේම තරඟය පරාජය වීමත් සමඟ පාසලේ කිසිදු ඉහළ බලධාරියෙකුට දැනුම් නොදී ඇය සිය අභිමතය පරිදි පාසල් බස් රිය පැමිණෙන තෙක් නොසිට පාරේ ධාවනය වූ සාමාන්‍ය බස්

රථයකින් දරුවන් නැවත පාසලට රැගෙන විත් නිස්සංකා ගුරුතුමියට සිද්ධිය පිළිබඳ දැනුම් දී ඇති අතර පළවන වගඋත්තරකාරියගේ ක්‍රියාකලාපය නිසා සමස්ථ සිද්ධිදාමය ආරම්භ වී ඇති බව නිරීක්ෂණය වේ.

එසේම වින්දිත දැරියගේ අධිකරණ වෛද්‍ය වාර්තාවේ "සෙන්ටිමීටර් ½ x 1 ප්‍රමාණයේ වම් අතේ ඉහල බාහුවේ ඉදිරිපස සීරීමක් නිරීක්ෂණය වූ බව" දක්වා ඇති අතර අධිකරණ වෛද්‍ය නිලධාරීගේ මතය පරිදි වින්දිත දැරිය විසින් සිය පැමිණිල්ලෙන් කියා සිටින පරිදි පළවන වගඋත්තරකාර භාග්‍යා ගුරුතුමිය විසින් තම අත කොනිත්තීම තහවුරු වන බව නිරීක්ෂණය වේ.

02. දෙවන වගඋත්තරකාර නිස්සංකා ගුරුතුමියට එම පාසලේම වසර 10 කට ආසන්න සේවා පළපුරුද්දක් සහිතව එම පාසලේ නේවාසිකව සේවය කරන සහ දරුවන්ගේ මානසිත තත්වයන් අනුව කටයුතු කිරීමට අධ්‍යාපන මනෝ විද්‍යා විෂය ඉගෙන ගෙන සිටින එසේම අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය පිළිබඳ වැටුප් සහිත වසරක පුහුණුව ලද මෙන්ම වෙනත් පුහුණු ලද ගුරුවරියකි.

ඇය විසින් දරුවන්ගෙන් තරහයේ විස්තර විමසා සිටින විට දෙව්නි විසින් භාග්‍යා ගුරුතුමියට බැණ වදිමින් "සිංහල තේරෙන්නේ නැද්ද" යනුවෙන් ඇසූ බවත් දැන ගත් පසු එම **ළමුන්ගෙන් සැර කරමින්** ඒ පිළිබඳ විමසා ඇති බව නිරීක්ෂණය වේ.

දෙවන වගඋත්තරකාරියට විස්තර කිම නිසා නිවුන් දියණියන් බැණ වදිමින් ආවේගශීලිව කතා කරමින් කලහකාරී ලෙස හැසිරීම පාලනයට **ඔවුන් දෙදෙනා පසෙකින් වාඩිකර තබා** මදක් එහාට ගොස් ඔවුන්ගේ මවට දුරකථන ඇමතුමක් ලබා ගෙන පසුව භාග්‍යා ගුරුතුමියට දුරකථනය ලබා දී නැවත ළමුන් සිටින ස්ථානයට පැමිණ සිදු කරන ලද ප්‍රකාශවයට දෙව්ණි දියණිය සමච්චලයට මෙන් හිනා වීම නිසා ආවේගශීලි වූ වගඋත්තරකාරිය **අත උස්සලා පහරක් ගහන්න හැදූ** බව කොමිෂන් සභා පරීක්ෂණයේදී පිළිගෙන ඇති අතර එය ධරණි දියණිය විසින් ඇයගේ දකුණු අත අල්ලා පිටු පසට තල්ලු කර ඇති බව ප්‍රකාශයක් දී ඇත. එය දැරියට පහරදීම වැලැක්වීමට දැරිය ගත් උත්සාහයක් බව නිරීක්ෂණයවේ.

පැමිණිල්ල මඟින් දෙවන වගඋත්තරකාර නිශ්ශංකා ගුරුතුමිය විසින් තම දියණිය වන දෙව්නි දණගස්සා අතින් කම්මුලට පහර දී මිට මොලවා වැරෙන් ඇයගේ හිසට පහර දී ඇති බව දක්වා ඇත. ඒ අනුව දෙවන වගඋත්තරකාරිය සිදුවීම දැන ගත්පසු ඒ පිළිබඳ නිවුන් දියණියන්ගෙන් සැරකරමින් ඇසූ බවත් දෙදෙනාම පසෙකින් වාඩිකර තැබූ බවත් අත් උස්සා පහරක් ගසන්නට හැදූ බවත් ලෙසින් පිළිගෙන ඇති බැවැනි පැමිණිල්ලෙන් දක්වා ඇති සිදුවීම එම අවස්ථාවේදී සිදුවීමට වැඩි ඉඩකඩක් පවතින බවට නිරීක්ෂණය වේ.

තවද දෙවන වගඋත්තරකාර නිස්සංකා ගුරුතුමිය මානව හිමිකම් කොමිසන් සභාව ඉදිරියේ 2024.08.28 දින පැවැති පරික්ෂණයේදී හා 2024.10.24 දින ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේදී හෙළිදරව් කර ඇති කරුණු සහ පැමිණිල්ල වෙතින් ඉදිරිපත් කර ඇති හඬපටයේ සඳහන් කරුණු සමඟ පරස්පර බව නිරීක්ෂණය වේ. එනම් පැමිණිල්ල විසින් දියණියන්ගේ මව සහ දෙවන වගඋත්තරකාර ගුරුතුමිය සමඟ පැවැති දුරකථන සංවාද අතරතුර වගඋත්තරකාර නිශ්ශංකා ගුරුතුමිය වින්දිත දැරියට කම්බුල ප්‍රදේශයට එක පහරක් එල්ල කල බවට ප්‍රකාශ කර සිටී.

03. නිස්සංකා ගුරුතුමිය පහරදීමට අත ඉස්සූ අවස්ථාවේ ධරණී දියණිය ඇයගේ දකුණු අතින් අල්ලා පිටු පසට තල්ලු කරන ලද පසුව දරුවකු විසින් ටැංකිය මත ඉන්දවීමෙන් අනතුරුව එම ස්ථානයට තුන්වන වගඋත්තරකාරිය වන නදීපා ගුරුතුමිය පැමිණ ළමුන්ගෙන් සිදු වීම පිළිබඳ විමසීමේදී නැවතත් නිවුන් දරුවන් දෙදෙනා කලහාකාරී ලෙස හැසිරී නිස්සංකා ගුරුතුමිය දෙසට පැමිණීම වැළැක්වීමට ඒ මැද්දට පැමිණී දෙපැත්තට කිරීමට ඇයගේ අත දිගු කළ බව කොමිෂන් සභාවේදී පිළිගෙන ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිල්ල මඟින් නිස්සංකා ගුරුතුමිය විසින් පහර දීමෙන් නොනැවතී තුන්වන වගඋත්තරකාරිය කැඳවා ඇයගේ පිටි අල්ලෙන් දියණියගේ කම්මුලට හා කණට වැරෙන් පහරක් එල්ල කර ඇති බව දක්වා ඇත. තුන්වන වගඋත්තරකාර නදීපා ගුරුතුමිය ඒ වනවිට අටමස් ගැබිණියක්ව සිටි නිස්සංකා ගුරුතුමිය වෙත පැමිණෙන දියණියන්ගෙන් ගුරුතුමිය බේරාගැනීමට කටයුතු කිරීමට දෙදෙනාගේ මැදට පැමිණ දියණියන් වැළැක්වීමට පැමිණිල්ලේ සඳහන් පරිදි ඇයගේ නොපිටි අල්ලෙන් දෙවිණි දියණියට පහර දී ඇති බවට නිරීක්ෂණය වේ.

තවද වගඋත්තරකාර නදීපා ගුරුතුමිය මානව හිමිකම් කොමිසන් සභාව ඉදිරියේ 2024.08.28 දින පැවැති පරීක්ෂණයේදී හා 2024.10.24 දින ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේදී හෙළිදරව් කර ඇති කරුණු සහ පැමිණිල්ල වෙතින් ඉදිරිපත් කර ඇති හඩපටයේ සඳහන් කරුණු සමඟ පරස්පර බව නිරීක්ෂණය වේ.

04. පාසලේ විදුහල්පති විසින් සිය 2022.10.03 දිනැති පැමිණිල් සම්බන්ධව යොමු කරන ලද වාර්තාව මඟින් මානව හිමිකම් කොමිෂමෙන් මෙම පැමිණිල්ල සැබැඳිව කිසිදු ආකාරයේ තොරතුරක් ඔහු වෙත පැමිණිලිකරු විසින් හෝ දැරියන් දෙදෙනා විසින් ඉදිරිපත් කර නොමැති බවත් අදාල දෙමාපියන්ට තමා හමුවෙන මෙන් පණිවිඩ යැවූවද ඔවුන් නොපැමිණි බවත් සියලු ක්‍රීඩා ගුරුවරුන් කැඳවා ඉදිරියේදී ගත යුතු ක්‍රියා මාර්ගයන් පිළිබඳව 2022.08.19 දින සාකච්ඡා කල බවත් 2022.08.20 දින පැවැත්වෙන සමථ මණ්ඩලයේදී චෝදනාවට ලක්ව සිටින ගුරුවරියන් තිදෙනාහට පැමිණිලිකරුවන් සමඟ සමථයකට පැමිණීමට කටයුතු කරන මෙන් දන්වා සිටි බව දක්වා ඇත. කෙසේ වෙතත් ඔහු මෙම සිද්ධිය සම්බන්ධයෙන් ඉන් එහා ගිය කිසිදු ස්වාධීන පරීක්ෂණයක් හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වේ.

05. පාසල් පරිසරය තුල විනය නිසි ලෙස පවත්වා ගැනීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2016.04.29 දිනැති චක්‍ර ලේඛ අංක12/2016 නිකුත් කර ඇත. එමඟින් පාසලක විනය ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම මැනවින් පහදා දී ශාරීරික දඬුවම් තහනම් කර ඇති අතර ඒ වෙනුවට ගතයුතු ක්‍රියා මාර්ග සැබැඳිව කරුණු විග්‍රහ කර ඇත. එවැනි දඬුවම් පැමිනවීම හේතුකොටගෙන නීතිමය ක්‍රියාමාර්ගයන්ට මෙන්ම විනය ක්‍රියාමාර්ගයන්ට මුහුණ දීමට සිදුවන බවද දක්වා ඇත.

06. In the case of **Bandara v. Wickremasinghe (1995) 2 SLR 167** in which the Petitioner, a school student had been assaulted during school hours by the Deputy Principal, Vice Principal and a teacher, Kulatunga J. observed that "the discipline of students was a matter within the purview of school teachers and that whenever they act with the objective of maintaining discipline, they act under the colour of office. Therefore, if in doing so, they exceed their power, they may become liable for the infringement of fundamental rights by executive and administrative action. මෙම නඩුවේ පෙත්සම්කරු, පාසල් සිසුවෙකුවූ අතර නියෝජ්‍ය විදුහල්පති, උප විදුහල්පති සහ ගුරුවරයෙකු

විසින් පාසල් වේලාවන් තුළ පහර දී ඇති බව සඳහන් කරමින් පෙත්සම ඉදිරිපත් කර තිබුණි. මෙම නඩුවේදී කුලතුංග විනිසුරුවරයා නිරීක්ෂණය කළේ, "සිසුන්ගේ විනය පාසල් ගුරුවරුන්ගේ විෂය පථයට අයත් කාරණයක් බවත්, ඔවුන් විනය පවත්වා ගැනීමේ අරමුණින් ක්‍රියා කරන සෑම විටම ඔවුන් තමන්ට සැබවින්ම නොපවතින එහෙත් මූලික වශයෙන් නීතිමය බලය හෝ අයිතිය පිළිබඳ මවාපෑමක් යටතේ ක්‍රියා කරන බවත්ය." කෙසේවෙතත් එවැනි කරනා වලදී ඔවුනගේ බලය ඉක්මවා ක්‍රියා කරන අවස්ථාවන්හිදී විධායක හා පරිපාලන ක්‍රියා මඟින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සඳහා ඔවුන් වගකිව යුතුය" යනුවෙනි.

07. තවද දැරිය මෙම සමස්ථ සිදුවීම හමුවේ මානසික බලපෑමකට ගොදුරුවීම නිසා දැරිය මානසික වෛද්‍ය සායනයක් වෙත යොමු කර ඇති බවත් ඉක්බිතිවද ප්‍රතිකාර සඳහා මානසික වෛද්‍ය සායනය සඳහා ගොස් ඇති බවත් නිරීක්ෂණය වේ.

08. <u>in the case of W.M.K. de Silva v. Chairman, Ceylon Fertilizer Corporation</u> **[1989] 2 S.L.R. 393** it was recognized that Article 11 of the Constitution is not confined to physical violence and encompasses protection against emotional or psychological harm as well. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව ශාරීරික හිංසනයට පමණක් සීමා නොවන බවත් භාවාත්මක හෝ මානසික හානිවලින් ආරක්ෂාව ද ඇතුළත් වන බවත් හඳුනා ගන්නා ලදී.

09. it was observed in the case of **<u>Wijesinghe Chulangani vs. Waruni Bogahawatte</u>** SC FR App No. 677/2012 (Supreme Court minutes; 12th June 2019) that while it is established law that in addition to a high degree of certainty, that a very high degree of maltreatment is also required to make a finding on cruel, inhumane, degrading treatment under Article 11, "… what amounts to a 'high degree of maltreatment' in relation to an adult does not always resonate with the mental 17 constitution of a minor. Therefore, when a minor complains of degrading treatment, the Court as the upper guardian must not be quick to dismiss the claims for failing to meet the same high threshold of maltreatment. Instead, it must carefully consider the impact the alleged treatment may have had on the mentality and the growth of the child." 11 වන ව්‍යවස්ථාව යටතේ කුරිරු, අමානුෂික, අවමන් සහගත සැලකිලි පිළිබඳ නිගමනයක් කිරීමට ඉහළ මට්ටමේ නිශ්චිතභාවයකට අමතරව, ඉතා ඉහළ මට්ටමේ හිංසනයක් ද අවශ්‍ය බව ස්ථාපිත නීතියක් වුවද, "... වැඩිහිටියෙකුට අදාළව 'ඉහළ මට්ටමේ හිංසනයක්' යනු බාල වයස්කරුවෙකුගේ මානසික මට්ටම සමඟ සැමවිටම සමාන නොවේ. එබැවින්, බාල වයස්කරුවෙකු අවමන් සහගත සැලකිලි ගැන පැමිණිලි කරන විට, ඉහළ භාරකරු ලෙස අධිකරණය එම ඉහළ මට්ටමේ හිංසන සැලකිලි සපුරාලීමට අපොහොසත් වීම සඳහා හිමිකම් ප්‍රතික්ෂේප කිරීමට හදිසි නොවිය යුතුය. ඒ වෙනුවට, චෝදනා කරන ලද ස්ථාවරය දරුවාගේ මානසිකත්වයට සහ වර්ධනයට ඇති කළ හැකි බලපෑම ප්‍රවේශමෙන් සලකා බැලිය යුතුය." ඒ අනුව වින්දිත දැරියට සිදුව ඇති මානසික වදහිංසාව කුරිරු, අමානුෂික, අවමන් සහගත සැලකිල්ලක් ලෙස සැලකීමට හැකි බව නිරීක්ෂණය වේ.

<u>**නිගමනය**</u>

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව ප්‍රකාරව " කිසිම තැනැත්තකු වද හිංසාවට හෝ කෘර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය." යන්න අනුල්ලංඝනීය අයිතිවාසිකමක් වශයෙන් සහතික කොට ඇත.

එසේම *<u>අමල් සුදත් සිල්වා එ. කොඩිතුවක්කු</u>* අතුකෝරල විනිසුරුතුමා සඳහන් කර ඇත්තේ, "අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි ව්‍යවස්ථාවට අනුව කිසිවකුත් කෘර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්කට හෝ දඬුවමකට යටත් නොවිය යුතු බවට විධානය කරනු ලබයි. එමඟින් සෑම පුද්ගලයකුටම වෙනකෙකු විසින් කුරිරු හෝ අමානුෂික ලෙස වධහිංසා පැමිණවීම තහනම් කෙරේ. මෙම රටෙහි සෑම පුද්ගලයකුම, ඔහු අපරාධකරුවකු වුවත් හෝ නොවුවත් මෙම අයිතිය පූර්ණ ලෙස සහතික කර ඇති ආකාරයටම හිමිකම ඇත්තේය".

ඒ අනුව, මෙම දියණියන්ගේ හැසිරීම පාසලට නොගැලපෙන හැසිරීමක් පෙන්නුම් කරන්නේ නම් ඒ සම්බන්ධව ශාරීරික දඬුවම් පැමිණ වීම නොකළ යුතු අතර ඒ සඳහා ක්‍රියාකළයුතු ආකාරය පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 12/2016 චක්‍ර ලේඛය මඟින් ප්‍රතිපාදන සලසා ඇත. එසේම ඔවුනගේ හැසිරීම උචිත නොවුවද උක්ත අධිකරණ තීරණයේ සඳහන් පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි ව්‍යවස්ථාව යටතේ තහවුරු කොට ඇති වදහිංසාවෙන් අත්මිදීමේ අයිතිය පාසල් යන පසුවන වයසේ ළමුන් කෙරෙහිද සුරක්ෂිත කොට ඇත්තේය.

ඒ සියළු කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී 1, 2 සහ 3 වන වගඋත්තරකරුවන් විසින් වින්දිත දෙවිනි රුබසිං ජයවර්ධන දියණිය සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමු.

එසේම පාසල වෙනුවෙන් ක්‍රිඩා කිරීමට යන දරුවන්ගේ ආරක්ෂාව සහ පසු විපරුම් විෂයෙහි නිසි පරිදි අවධානයෙන් කටයුතු නොකිරීම සම්බන්ධයෙන් 4 වන වගඋත්තරකාර විදුහල්පතිවරයා සිය අධීක්ෂණ සහ විදුහල්පතිවරයෙකුගේ කාර්යභාරය අතපසු කිරීමේ වගකීමට යටත්වන බවද නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත නිර්දේශයන් ඉදිරිපත් කර සිටී ;**

1. 1 වන 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් එක් අයකුගෙන් රු.5000/- බැගින් රු.15000/- ක මුදලක් පැමිණිලි පාර්ශවය වෙත ගෙවිය යුතුය.

<u>**ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින්,**</u>

2. පළමුවන වගඋත්තරකාර බී. භාග්‍යා පියුමලි මැන්දිස්, දෙවන වගඋත්තරකාර එච්. පී. දේවිකා සදමාලි නිශ්ශක සහ තුන්වන වගඋත්තරකාර පී. ජී. එච්. නදීපා නිල්මිණී තිලකරත්න යන මහත්මීන් සම්බන්ධයෙන් පරීක්ෂා කොට සුදුසු පියවර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු ය.

3. සිච්චන වගඋත්තරකරු වන ඩී ඩබ්ලිව්. ඩී. ආර්. ජේ. පී. සුරසේන මහතා (විදුහල්පති) විසින් මෙම සිදුවීමේදී ක්‍රියාකර ඇති ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂා කොට සුදුසු පියවර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු ය.

2025.10.23 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ (7)15 වන වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

.1 අමාත්‍යතුමිය, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. - කා.දැ.ගැ.ස.

2. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල - ඉහත නිර්දේශය ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා

සැ.යු. - අදාල වන්දි මුදල 'මුදල් ඇණවුමක්' මඟින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.